Lesson 12

# අතීතයේදී සිදු වූ ක්‍රියා

අපි මේ පාඩමේදී ඉගෙන ගන්නේ සිදු කර අවසන් වූ ක්‍රියා එනම් අතීතයේදී සිදු වූ ක්‍රියා. මෙහි ව්‍යාකරන සැලැස්ම හරි සරලයි. අතීත ක්‍රියාවන් ප්‍රකාශ කිරීමේදී භාවිත වෙන්නේ ක්‍රියා පදයේ අතීත රූපය , එනම් අදාල ක්‍රියාව "කලා" යනුවෙන් හැඟවෙන රූපය. මෙහිදී කර්තෘගේ ඒක වචන බහු වචන ස්වරූපය අදාල වෙන්නේ නෑ. කුමන ආකාරයේ කතෘ කෙනෙකු සමඟ වුවත් එකම විදියට තමයි වාක්‍යය සකස් වෙන්නේ. මේ කාලයට කියන්නේ Simple past tense - සරල අතීත කාලය කියල

සරල අතීත කාලයේ වාක්‍යය සෑදෙන්නේ මේ විදියට

- කතෘ + ක්‍රියාව (අතීත ) + කර්මය

අපි බලමු උදාහරණ

I went there yesterday.
අයි වෙන්ට් දෙයා(ර්) යෙස්ට(ර්)ඩේ
මම ඊයේ එහේ ගියා.

They came here last week
දේ කේම් හියර(ර්) ලාස්ට් වීක්
ඔවුන් ගිය සතියේ මෙහෙ ආවා

I saw her this morning
අයි සෝ හ(ර්) දිස් මෝනිං
මම අද උදේ ඇයව දැක්කා

You did it well
යූ ඩිට් ඉට් වෙල්
ඔයා ඒක හොඳට කළා

I threw it away
අයි ත්‍රෑ ඉට් අවේ
මම ඒක වීසි කළා

She called me last night
ෂී කෝල්ඩ් මී ලාස්ට් නයිට්
ඇය ඊයේ රෑ මට කතා කළා

We met in a restaurant.
වී මෙට් ඉන් අ රෙස්ටුරන්ට්
අපි අවන්හලකදී මුණ ගැසුනා

He went abroad for studies
හී වෙන්ට් අබ්‍රෝඩ් ෆෝ ස්ටඩීස්
ඔහු අධ්‍යාපන කටයුතු සඳහා රටගියා

We won the game
වී වොන් ද ගේම්
අපි තරගය දින දිනුවා

She cried bitterly
ෂී ක්‍රයිඩ් බිට(ර්)ලි
ඇය දුකින් ඇඬුවා

- ❖ **නැතාර්ථය**

  සිදු වී අවසන් වූ ක්‍රියා ,එනම් අතීත කාල ක්‍රියා වල නැතාර්ථය ප්‍රකාශ කිරීමේදී කාරණා දෙකක් සිදු වෙනවා

- ක්‍රියා පදයට පෙර did not එකතු වෙනවා
- අතීත රූපයෙන් තිබෙන ක්‍රියාපදය යලි වර්තමාන රූපයට,එනම් එහි මුල් රූපයට පැමිණෙනවා. (මෙහිදී ඔබට වැදගත් වෙනවා අපි අර කලින් පාඩමකදී දුන්නු ක්‍රියාපද ලැයිස්තුව ගැන අවධානය යොමු කරන එක)

අපි උදාහරණයක් ගෙන බලමු

I went
අයි වෙන්ට්
මම ගියා

දැන් අපිට කියන්න ඕන මම ගියේ නැහැ කියලා . කලින් කිව්වා වගේ ක්‍රියා පදයට කලින් did not එකතු වෙනවා

I did not (went)

දැන් ඊළඟට ක්‍රියා පදය වර්තමාන කාලයට හැරෙනවා.

I did not (go ← went )

Went කියන අතීත කාල ක්‍රියා පදය එහි වර්තමාන රූපය වන go වලට හැරුනා .දැන් වාක්‍යය සම්පූර්ණයි

I did not go
අයි ඩිඩ් නොට් ගෝ
මම ගියේ නැහැ

තවත් උදාහරණ

I **saw** her this morning → I did not **see** (← saw) her this morning

අයි සෝ හ(ර්) දිස් මෝනිං

මම ඇයව දැක්කා අද උදේ

අයි ඩිඩ් නොට් සී හ(ර්) දිස් මෝනිං

මම ඇයව දැක්කේ නෑ අද උදේ

He **came** here last week → He did not **come** (← came)here last week

හී කේම් හියර්(ර්) ලාස්ට් වීක්

ඔහු මෙහෙ ආවා ගිය සතියේ

හී ඩිඩ් නොට් කම් හිය(ර්) ලාස්ට් වීක්

ඔහු මෙහේ අවේ නෑ ගිය සතියේ

We **went** there last week week → We did not **go** (←went ) there last

වී වෙන්ට් දෙයා ලාස්ට් වීක්

අපි ගිය සතියේ එහෙ ගියා

වී ඩිඩ් නොට් ගෝ දෙයා ලාස්ට් වීක්

අපි ගිය සතියේ එහෙ ගියේ නැහැ

She **called** me last night → She didn't **call** (← called ) me last night

ෂී කෝල්ඩ් මී ලාස්ට් නයිට්

ඇය මට ඊයේ රෑ කතා කලා

ෂී ඩිඩ්න්ට් කෝල් මී ලාස්ට් නයිට්

ඇය මට ඊයේ රෑ කතා කලේ නෑ

You **did** it well → You did not **do** (← did ) it well

යූ ඩිඩ් ඉට් වෙල්

ඔයා ඒක හොඳට කලා

යූ ඩිඩ් නොට් ඩු ඉට් වෙල්

ඔයා ඒක හොඳට කලේ නෑ

(මේ වාක්‍යයේ අතීත කාල ක්‍රියාව did . එහි වර්තමාන රූපය do . දැන් අතීත කාල නැතාර්ථයේදී ක්‍රියාව කලේ නැහැ කියන්නේ did not වලින් . ක්‍රියාව සඳහන් කරන්නේ එහි වර්තමාන කාලයෙන් , ඒ කියන්නේ එතන එන්නේ, do . ඉංග්‍රීසි ව්‍යාකරණ වල මෙවැනි පැටලිලි සහගත තැන් ප්‍රවේශමෙන් තේරුම් ගන්න උත්සාහ කරන්න )

- (did not කෙටි කර didn't ලෙස භාවිතා කල හැකියි. බොහෝ විට ප්‍රයෝගික කථාවේදී භාවිතා වෙන්නේ ඒ විදියට.)

- **ප්‍රශ්නාර්ථය**

- අතීත කාල ක්‍රියා වල ප්‍රශ්නාර්යේ දී did ඉදිරියට එනවා.
- ඒ වගේම ක්‍රියාව එහි මුල් රූපයෙන්ම (වර්තමාන) පවතිනවා

බලමු එහි වාක්‍යය සෑදෙන රටාව

| | | |
|---|---|---|
| He went there<br>හී වෙන්ට් දෙයා<br>ඔහු එහෙ ගියා | → | Did he go (go ←went) there ?<br>ඩිඩ් හී ගෝ දෙයා<br>ඔහු එහෙ ගියාද ? |
| She blamed him<br>ශී බ්ලේම්ඩ් හිම්<br>ඇය ඔහුට බැන්නා | → | Did she blame (blame ← blamed ) him ?<br>ඩිඩ් ෂී බ්ලේම් හිම්<br>ඇය ඔහුට බැන්නද ? |
| She saw him<br>ෂී සෝ හිම්<br>ඇය ඔහුව දැක්කා | → | Did she see ( see ← saw )him ?<br>ඩිඩ් ෂී සී හිම් ?<br>ඇය ඔහුව දැක්කද ? |
| They talked loudly<br>දේ ටෝක්ඩ් ලවුඩ්ලි<br>ඔවුන් හයියෙන් කතා කළා | → | Did they talk (talk ← talked) loudly ?<br>ඩිඩ් දේ ටෝක් ලවුඩ්ලි<br>ඔවුන් හයියෙන් කතා කලාද ? |

තවත් උදාහරණ

Did you see her this morning?

ඩිඩ් යූ සී හ(ර්) දිස් මෝනිං?

ඔයා ඇයව දැක්කද අද උදේ?

Did he come here last week?

ඩිඩ් හී කම් හිය(ර්) ලාස්ට් වීක්

ඔහු මෙහෙ ආවද ගිය සතියේ?

Did you go there yesterday?

ඩිඩ් යූ ගෝ දෙය(ර්) යෙස්ට(ර්)ඩේ?

ඔයා එහේ ගියාද ඊයේ ?

- එහි සෘන ප්‍රශ්නාර්ථය සඳහා උදාහරණ ගනිමු. එවිට did not (didn’t) වාක්‍යයේ ඉදිරියට එනවා

Didn’t you go there yesterday.?

ඩිඩ්න්ට් යූ ගෝ දෙයා(ර්) යෙස්ට(ර්)ඩේ?

ඔයා ඊයේ එහේ ගියේ නැද්ද?

Didn’t they come here?

ඩිඩ්න්ට් දේ කම් හියර්(ර්)?

ඔවුන් මෙහෙ ආවෙ නැද්ද ?

Didn’t she call you?

ඩිඩ්න්ට් ෂී කෝල් යූ ?

ඇය ඔබට කෝල් කලේ නැද්ද?

එදිනෙදා ව්‍යවහාරයේදී භාවිතා වන අතීත කාල ක්‍රියාවන් සඳහා උදාහරණ රාශියක් අපිට ඊළඟ පාඩමේදී අධ්‍යනය කල හැකියි. එතෙක් ඔබට පුලුවන්ද බලන්න මේ අභ්‍යාසය කරන්න.

අවශ්‍ය වචන සහ ක්‍රියා පදයේ අතීත සහ වර්තමාන රූප දෙකම දී තිබෙනවා. ගැලපෙන රූපය ඔබ තෝරා ගත යුතුයි. එමෙන්ම අවශ්‍ය තැන did හෝ did not ඔබ විසින් යෙදිය යුතුයි.

Ex: 5

1 මම ඇගේ ඉගෙනීම් කටයුතු වලදී ඇයට උදව් කලා.

(I,(help,helped),her,in her studies)

2. ඔහු මට සල්ලි ටිකක් දුන්නා

(He,(give.gave) ,me ,some money )

3. ඇය අළුත් සාරියක් ගත්තා.

(She (buy ,bought ) ,a new saree)

4. මට ඔහුව හමුවුනේ නෑ.

(I, (meet,met) ,him )

5. ඇය මට ඒ ගැන කිව්වේ නැහැ.

(She,(tell,told),me,about that )

6. ඔවුන් වෙඩින් එකට ආවෙ නැහැ.

(They ,(come,came),to the wedding)

7. මම ඊයේ රෑ හොඳට නිදාගත්තේ නැහැ.

(I,(sleep,slept) ,well,last night)

8. ඊයේ ඇය ආවද?

(She,(come,came),yesterday?)

9. ඔයා ඔහුට බැන්නද?

(He,(blame,blamed),him?)

10. ඔවුන් මහන්සියෙන් වැඩ කලාද ?

(They,(work,worked),hard?)

11. ඔවුන්ඔයාලට උදව් කලේ නැද්ද?

(They,(help,helped),you?

12. ඇය ඔයත් එක්ක එකඟ වුනේ නැද්ද?

(She,(agree,agreed),with you?)

Lesson 12 **Spoken English**

මේ පාඩමේදී අපි ඉගෙන ගමු කඩේකින් බඩු ගන්න හැටි . ඔබට අවශ්‍ය යම් බඩුවක් තියෙනවද , ඒවායේ මිල ගණන් කොහොමද ආදිය විමසන හැටි . මේ දැනුම ඉතාම ප්‍රයෝජනවත් දැනුමක්

වෙළඳ සලකට ගිහිල්ල යමක් මිලට ගන්න විමසනවා නම් ඒ සඳහා යොදා ගත හැකි හොද වාක්‍යයක් තමයි Do you have …….?

- Do you have ……. ? ඩූ යූ හෑව් ? - ඕගොල්ලෝ ලග තියෙනවද ?

Do you have sugar ?
ඩූ යූ හෑව් ෂුග(ර්) ?
ඕගොල්ලෝ ළඟ සීනි තියෙනවද ?

Do you have phone cards ?
ඩූ යූ හෑව් ෆෝන් කාඩ්ස් ?
ඕගොල්ලෝ ළඟ ෆෝන් කාඩ්ස් තියෙනවද ?

Do you have any vegetables ?
ඩූ යූ හෑව් එනි වෙජිටබල්ස් ?
ඕගොල්ලෝ ළඟ එළවලු මොනවා හරි තියෙනවද ?

Do you have milk ?
ඩූ යූ හෑව් මිල්ක් ?
ඕගොල්ලෝ ළඟ කිරි තියෙනවද ?

Do you have rice flour
ඩූ යූ හෑව් රයිස් ෆ්ලව(ර්)
ඕගොල්ලෝ ළඟ හාල් පිටි තියෙනවද ?

Do you have bread ?
ඩූ යූ හෑව් බ්‍රෙඩ් ?
ඕගොල්ලෝ ළඟ පාන් තියෙනවද ?

Do you have yogurt ?
ඩූ යූ හෑව් යෝගට් ?
ඕගොල්ලෝ ළඟ යෝගට් තියෙනවද ?

අපි බලමු කෙටි උදාහරණ සංවාද කීපයක් . ඒවායේ තිබෙනවා යම් දෙයක් තියෙනවද කියලා අහන හැටි , ඒ වගේම ඒවායේ මිල විමසන හැටි සහ අවසානයේ ඒ භාණ්ඩයේ තමන්ට අවශ්‍ය ප්‍රමාණය ඉල්ලන හැටි

Dialogue 1

A : Do you have sugar ?
ඩූ යූ හෑව් ෂුග(ර්) ?
ඕගොල්ලෝ ළඟ සීනි තියෙනවද ?

B : Yes, we have sugar.
යස් , වි හෑව් ෂුග(ර්)
ඔව් , අපි ලග සීනි තියෙනවා

A : How much is one kilo ?
හව් මච් ඉස් වන් කිලෝ ?
කිලෝ එකක් කීයද ?

B : It's 250 rupees per kilo
ඉට්ස් ටූ හන්ඩ්‍රඩ් ෆිෆ්ටි රුපීස් ප(ර්) කිලෝ
කිලෝ එක දෙසිය පනහයි

A : Please give me a kilo .
ප්ලීස් ගිව් මී අ කිලෝ
මට කිලෝ එකක් දෙන්න

Dialogue 2

A: Do you have any toothpaste?
ඩූ යූ හෑව් එනි ටූත් පේස්ට් ?
ඕගොල්ලෝ ළඟ දත් බෙහෙත් තියෙනවද ?

B: Yes, we have.
යස් , වී හෑව්
ඔව් , අපි ලග තියෙනවා

A: How much is it?
හව් මච් ඉසිට් ?
කීයද ?

B: A small one is 85 rupees
අ ස්මෝල් වන් ඉස් එයිටි ෆයිව් රුපීස්
පොඩි එකක් රුපියල් අසූ පහයි

A: Okay, give me a small one
ඕකේ ,ගිව් මී අ ස්මෝල් වන්
හරි , මට පොඩි එකක් දෙන්න

Dialogue 3

A: Do you have any milk?
ඩූ යූ හෑව් එනි මිල්ක්
ඕගොල්ලෝ ළඟ කිරි තියෙනවද ?

B: Yes, we have milk
යස්, වී හෑව් මිල්ක්
ඔව් , අපි ලග කිරි තියෙනවා

A: How much does it cost?
හව් මච් ඩස් ඉට්(ඩසිට් ) කොස්ට් ?
කීයද ගාන ? (යම් දෙයක ගාන අහන කොට මේ විදියත් ඉතාම හොඳ විදියක් ගාන අහන්න )

B: It's 250 Rupees per 1 liter bottle
ඉට්ස් ටූ හන්ඩ්‍රඩ් ප(ර්) වන් ලීට(ර්) බොට්ල්
ලීටර් එකේ බෝතලයක් දෙසියේ පනහයි

A: I'll take 2 bottles, please.
අයිල් ටේක් ටූ බොට්ල්ස් , ප්ලීස්
මම දෙකක් ගන්නවා (කරුණාකර මට දෙකක් දෙන්න )

Dialogue 4

A: Do you have any yogurt ?
ඩූ යූ හෑව් එනි යෝගට්
ඕගොල්ලෝ ළඟ යෝගට් තියෙනවද ?

B: Yes, we have two different kinds.Plain one and the flavoured one
යස් , වී හෑව් ටූ ඩිෆරන්ට් කයින්ඩ්ස් . ප්ලේන් වන් ඇන්ඩ් ද ෆ්ලේව(ර්)ඩ් වන්
ඔව් , අපි ලග ජාති දෙකක් තියෙනවා , ප්ලේන් එකයි , රස කල එකයි (flavour-

රසය      flavoured - රස කල )

A: How much is the plain one?
හව් මච් ඉස් ද ප්ලේන් වන් ?
ප්ලේන් එක කීයද ?

B: It's 80 Rs .
ඉට්ස් එයිට් රුපීස්
රුපියල් අසූවයි

A: Okay, I'll take two.
ඕකේ , අයිල් ටේක් ටූ
හරි , මම දෙකක් ගන්නවා

Dialogue 5

A: Do you have rice flour?
ඩූ යූ හෑව් රයිස් ෆ්ලව(ර්)
ඕගොල්ලෝ ලග හාල් පිටි තියෙනවා

B: Yes, we have it
යස් , වී හෑව් ඉට්
ඔව් , ඔව් , අපි ලග තියෙනවා

A: How much is it ?
හව් මච් ඉසිට් ?
කීයද ?

B: It's 200 Rs for a packet of 250g.
ඉට්ස් ටූ හන්ඩ්‍රඩ් ෆෝ අ පැකට් ඔෆ් ටූ හන්ඩ්‍රඩ් ෆිෆ්ටි ග්රෑම්ස්
ග්‍රෑම් දෙසිය පනහේ පැකට් එක රුපියල් දෙසීයයි

A: I'll take one packet.
අයිල් ටේක් වන් පැකට්
මම පැකට් එකක් ගන්නවා

- ❖ කඩේකට ගිහින් බඩු ගන්න කොට මට යම් දෙයක් ගන්න පුලුවන්ද ? කියලා අහන්න තවත් හොඳ විදියක් තමයි Can I have ……? කැන්(කැනයි) අයි හෑව් ….? කියන රටාව

Can I have a bottle of water?
කැනයි අයි හෑව් අ බොට්ල් ඔෆ් වෝට(ර්) ?
මට වතුර බෝතලයක් ගන්න පුලුවන්ද ?

Can I have a loaf of bread?
කැනයි අයි හෑව් අ ලෝෆ් ඔෆ් (ලෝෆොෆ් ) බ්‍රෙඩ් ?
මට පාන් ගෙඩියක් ගන්න පුලුවන්ද ?

Can I have some carrots?
කැනයි අයි හෑව් සම් කැරට්ස් ?
මට කැරට් ටිකක් ගන්න පුලුවන්ද ?

Can I have a packet of biscuits?
කැනයි අයි හෑව් අ පැකට් ඔෆ් බිස්කට්ස් ?
මට බිස්කට් පැකට් එකක් ගන්න පුලුවන්ද ?

Can I have a bottle of coconut oil?
කැනයි හෑව් අ බොට්ල් ඔෆ් කොකනට් ඔයිල් ?
මට පොල් තෙල් බෝතලයක් ගන්න පුලුවන්ද ?

Can I have 6 eggs?
කැනයි අයි හෑව් සික්ස් එග්ස් ?
මට බිත්තර හයක් ගන්න පුලුවන්ද

අපි බලමු උදාහරණ දෙබස් කීපයකුත් . එවිට ඒ විමසීම් වලට ප්‍රතිචාර දක්වන විදියත් දැනගන්න පුළුවන්

Dialogue 6

A: Can I have a bottle of water?
කැනයි අයි හෑව් අ බොට්ල් ඔෆ් වෝට(ර්) ?
මට වතුර බෝතලයක් ගන්න පුලුවන්ද ?

B: Sure , but we have only 1.5 l bottles
ෂුව(ර්) , බට් වී හෑව් ඕන්ලි වන් පොයින්ට් ෆයිව් ලීට(ර්) බොට්ල්ස්

නිසැකවම, නමුත් අපි ලග තියෙන්නේ ලීටර් එක හමාරේ බෝතල් විතරයි

A: That's  fine. How much is it?"
දැට්ස් ෆයින් . හව් මච් ඉසිට් ?
ඒකට  කමක් නෑ  . කීයද  ගාන ?

B: It's 150 rupees
ඉට්ස් වන්  ෆිෆ්ටි  රුපීස්
රුපියල් එකසිය පනහයි

A: Okay, I'll take one.
ඕකේ  , අයිල් ටේක්  වන්
හරි , මං  එකක් ගන්නම්

Dialogue 7

A: Can I have a loaf of bread?
කැනයි අයි හෑව් අ ලෝෆ් ඔෆ් බ්‍රෙඩ් ?
මට පාන් ගෙඩියක් ගන්න පුලුවන්ද ?

B: Of course! We have fresh loaves.(loaf කියන එකේ බහු වචනේ loaves )
ඔෆ් කෝස්  , වී හෑව්  ෆ්‍රෙෂ් ලෝව්ස්
ඔෆ් කෝස් ! අපි ලග අලුත් පාන් ගෙඩි තියෙනවා

A: How much is it?
හව්  මච් ඉසිට් ?
කීයද ?

B: It's 180 rupees.
ඉට්ස් වන් එයිටි රුපීස්
රුපියල් අසූවයි

A: Give me one, please.
ගිව්  මී  වන් ප්ලීස්
මට එකක් දෙන්න

Dialogue 8

A: Can I have some carrots?
කැනයි අයි හෑව් සම් කැරට්ස් ?
මට කැරට් ටිකක් ගන්න පුලුවන්ද ?

B: Yes, we have fresh carrots today
ය(ඊ)ස් , වී හෑව් ෆ්‍රෙෂ් කැරට්ස් ටුඩේ
ඔව් , අද අපි ලග අලුත් කැරට්ස් තියෙනවා

A: How much per kilo?
හව් මච් ප(ර්) කිලෝ ?
කිලෝ එක කියද ?

B: It's 600 rupees per kilo.
ඉට්ස් සික්ස් හන්ඩ්‍රඩ් රුපීස් ප(ර්) කිලෝ
කිලෝ එක හැටයි

A: Okay, I'll take one kilo.
ඕකේ අයිල් ටේක් වන් කිලෝ
හරි මම කිලෝ එකක් ගන්නවා

Dialogue 9

A: Can I have a packet of biscuits?
කැනයි අයි හෑව් අ පැකට් ඔෆ් බිස්කට්ස් ?
මට බිස්කට් පැකට් එකක් ගන්න පුලුවන්ද ?

B: Sure, which brand do you prefer?
ෂුව(ර්) , විච් බ්‍රෑන්ඩ් ඩූ යූ ප්‍රිෆ(ර්) ?
නිසැකවම ! මොන වර්ගයටද ඔයා වඩා කැමති ?

A: I'll take the chocolate ones.
අයිල් ටේක් ද චොක්ලට් වන්ස්
මම චොක්ලට් ඒවා ගන්නම්

B: That’s 80 rupees
දැට්ස් එයිට් රුපීස්
රුපියල් අසූවයි

A: Okay, thanks!
ඕකේ , තෑන්ක්ස් !
හරි , ස්තූතියි

Dialogue 10

A: Can I have a bottle of coconut oil?
කැනයි අයි හෑව් අ බොට්ල් ඔෆ් කොකනට් ඔයිල් ?
මට පොල් තෙල් බෝතලයක් ගන්න පුලුවන්ද ?

B: Yes, we have 1-liter and 2-liter bottles. Which one do you want?
ය(ර්)ස් , වී හෑව් වන් ලීට(ර්) ඇන්ඩ් ටූ ලීට(ර්) බෝට්ල්ස් . විච් වන් ඩූ යූ වෝන්ට් ?
ඔව් , අපි ගාව ලීටර් එකේ ඒවා තියෙනවා , දෙකේ ඒවා තියෙනවා . කොයි එකද ඔයාට ඕන ?

A: I’ll take the 1-liter bottle.
අයිල් ටේක් ද වන් ලීට(ර්) බොට්ල්
මම ලිටරේ බෝතලේ ගන්නම්

B: That’s 180 rupees.
දැට්ස් වන් හන්ඩ්‍රඩ් එයිට් රුපිස්
රුපියල් එකසිය අසූවයි

A: I’ll take it.
අයිල් ටේක් ඉට්
මම ඒක ගන්නම්

Dialogue 11

A: Can I have 6 eggs?
කැනයි අයි හෑව් සික්ස් එග්ස් ?
මට බිත්තර හයක් ගන්න පුලුවන්ද

B: Sure, we have fresh eggs today
ෂුවර්) , වී හෑව් ෆ්‍රෙෂ් එග්ස් ටුඩේ
අනිවාර්යයෙන් , අද අපි ලඟ අලුත් බිත්තර තියෙනවා

A: How much for six ?
හව් මච් ෆෝ සික්ස් ?
හයට කීයද ?

B: It's 300 rupees for six
ඉට්ස් ත්‍රී හන්ඩ්‍රඩ් රුපීස් ෆෝ සික්ස්
හයට තුන් සීයයි

A: Here 's the money
හියර්)ස් ද මනි
මෙන්න සල්ලි

B : Thanks !
තෑන්ක්ස්
ස්තූතියි

හොදයි ,ඉහත සියලුම අවස්ථා වල කඩේට ගිහිල්ලා ඉල්ලපු බඩු කඩේ තිබුනා , යම් විදියකින් ඒ ඉල්ලන භාණ්ඩය කඩේ නොතිබුනොත් කොහොමද ඒ සංවාදය වෙන්න පුළුවන් කියල මීලගට බලමු.

Dialogue 12

A: Do you have any butter?
ඩූ යු හෑව් එනි බටර්) ?
ඕගොල්ලෝ ළඟ බටර්) තියෙනවද ?

B: I'm sorry, we don't have butter today.
අයිම් සොරි , වී ඩෝන්ට් හෑව් බටර්) ටුඩේ
සමාවෙන්න , අපි ලග බටර්) නැහැ අද

Dialogue 13

A: Do you have any tomatoes ?
ඩූ යූ හැව් එනි ටොමාටෝස් ?
ඕගොල්ලෝ ලග තක්කාලි තියෙනවද ?

B: Sorry, we're out of tomatoes today.
සොරි , වී ආ අවුට් ඔෆ් ටොමාටෝස් ටුඩේ ?
සමාවෙන්න , අද අපි ලග තක්කාලි නැහැ [We are out of ……. , එය හොඳ විදියක් යම් භාණ්ඩයක් ඉවර වී ඇති බව කියන්න ]

Dialogue 14

A: Do you have brown sugar?
ඩූ යූ හැව් බ්‍රවුන් ෂුග(ර්) ?
ඕගොල්ලෝ ලග දුඹුරු සීනි තියෙනවද ?

B: We've run out of brown sugar
වී හැව් රන් අවුට් ඔෆ් බ්‍රවුන් ෂුග(ර්)
අපි ලග දුඹුරු සීනි ඉවර වෙලා

[We have run out of brown sugar. ඒක හොඳ වාක්‍යයක්. මොනවා හරි ඉවර නම් ඒ දේ run out of ……. කියල කියනවා ]

හොදයි , ඉහත උදාහරණයේදී මුදලාලි වෙන දෙයක් යෝජනා කලොත්, ඒක කොහොමද එය ඉදිරිපත් කරන්නේ ?

B: Would you like white sugar instead?
වුඩ් යු ලයික් වයිට් ෂුග(ර්) ඉන්ස්ටෙඩ් ?
ඒ වෙනුවට ඔයා සුදු සීනි වලට කැමතිද ? (Instead -ඉන්ස්ටෙඩ් - ඒ වෙනුවට )
(Would you like …කියන්නේ යමකට කැමතිද කියලා අහන ආචාරශීලි ක්‍රමයක් )

A: No, thanks
නෝ, තෑන්ක්ස්
නෑ ස්තුතියි

ඊළගට බලමු මිලදී ගන්න කෙනා තමන් ඉල්ලන දේ නැත්නම් වෙන දෙයක් තියෙනවද කියලා අසන උදාහරණයක්

Dialogue 15

A: Can I have a loaf of bread?
කැනයි හෑව් අ ලෝෆ් ඔෆ්(ලෝෆොෆ්) බ්‍රෙඩ් ?
මට පාන් ගෙඩියක් ගන්න පුලුවන්ද ?

B: We've sold out of bread.
වී හෑව් සොල්ඩ් අවුට් ඔෆ්(අව්ටොෆ් )බ්‍රෙඩ්
අපේ පාන් ඉවරයි(විකිණිලා ඉවරයි )

A: Oh, Do you have any other types?
ඔහ් , ඩූ යූ හෑව් එනි අද(ර්) ටයිප්ස් ?
ඔහ් , ඕගොල්ලෝ ගාව වෙන ජාති(පාන් ජාති ) නැද්ද ?

B: Yes, we have brown bread.
යස් වී හෑව් බ්‍රවුන් බ්‍රෙඩ්
ඔව් , අපි ගාව බ්‍රවුන් බ්‍රෙඩ් තියෙනවා

A: Okay, I'll take brown bread then.
ඕකේ , අයිල් ටේක් බ්‍රවුන් බ්‍රෙඩ් දෙන්
හරි , මම එහෙනම් බ්‍රවුන් බ්‍රෙඩ් ගන්නම්

- ඒ දෙබසේ තවත් හොඳ යෙදුමක් ආව. මොනවා හරි විකිණිලා ඉවර නම් අපට කියන්න පුළුවන් We've sold out of ……… කියලා

අපි තවත් දෙබසක් ගෙන බලමු

Dialogue 16

A: Can I get a bottle of olive oil?
කැනයි ගෙට් අ බොට්ල් ඔෆ් ඔලිව් ඔයිල් ?
මට ඔලිව් ඔයිල් බෝතලයක් ගන්න පුලුවන්ද ?

B: Sorry, we've sold out of olive oil.
සොරි , වී හෑව් සෝල්ඩ් අවුට් ඔෆ් ඔලිව් ඔයිල්
සමාවෙන්න , අපේ ඔලිව් ඔයිල් විකිණිලා

A: Oh, I'll check another store.
ඔහ් , අයිල් චෙක් අනද(ර්) ස්ටෝ
ආ , මම වෙන කඩයක බලන්නම්

සමහර විට කඩේ මුදලාලි කියන්න පුළුවන් " හෙට නම් ඔලිව් ඔයිල් ගේනවා. හෙට ආවොත් ගන්න පුළුවන්" කියලා

B: We'll have olive oil tomorrow if you can wait until tomorrow
වී විල් හෑව් ඔලිව් ඔයිල් ටුමොරෝ ඉෆ් යූ කැන් වේට් අන්ටිල් ටුමෝරෝ
අපිට ඔලිව් ඔයිල් ලැබෙනවා හෙට ,ඔයාට ඉන්න පුළුවන් නම් හෙට වෙනකල්

ඒකම මෙහෙම කියන්නත් පුළුවන්

We will get new stocks tomorrow
වී විල් ගෙට් නිව් ස්ටොක්ස් ටුමෝරෝ
අපිට හෙට අලුත් තොග ලැබෙනවා

A: Okay, if I cannot find it elsewhere, I'll come back tomorrow.
ඕකේ , ඉෆ් අයි(ඉෆයි ) කැනොට් ෆයින්ඩ් ඉට් එල්ස්වෙයා ,අයි විල් කම් බැක් ටුමාරෝ
හරි , මට වෙන තැනකින් හොයා ගන්න බැරි වුනොත් , මම හෙට එන්නම්
[elsewhere - වෙන තැනක , වෙන කොහේ හරි]

තවත් දෙබසක් ගනිමු

Dialogue 17

A: Do you have chocolate ice cream?
ඩූ යූ හෑව් චොකලට් අයිස් ක්‍රීම් ?
ඕගොල්ලෝ ලග චොක්ලට් අයිස් ක්‍රීම් තියෙනවද ?

B: Sorry, we're out of chocolate ice cream.
සොරි වී ආ අවුට් ඔෆ් චොක්ලට් අයිස් ක්‍රීම්
සොරි , අපි ලග චොකලට් අයිස් ක්‍රීම් නැහැ

A: Do you have vanilla?
ඩූ යූ හෑව් වැනිලා ?
ඕගොල්ලෝ ලග වැනිලා (අයිස් ක්‍රීම්) තියෙනවද ?

B: Yes, we do.
යස් වී ඩූ
ඔව් , අපි ලග තියෙනවා (මෙතන we do කියන්නේ we have කියන එක

A: Okay, I'll take vanilla ice cream then
ඕකේ අයිල් ටේක් වැනිලා අයිස් ක්‍රීම් දෙන්
හරි , මම එහෙනම් වැනිලා අයිස් ක්‍රීම් ගන්නම්

ලස්සනයි නේද ඒ සංවාද ? ඒවා ලංකාවේ නෙවෙයි , ලෝකේ ඕනෑම තැනක භාවිතයට ගත හැකි හොදම ඉංග්‍රීසි වලින් ලියවිලා තියෙන්නේ . ඒ නිසා ඒ දෙබස් , ඒ වාක්‍යය හොදින් මතක තබා ගන්න . ඒවා ඉතාම ප්‍රයෝජනවත්. හොදයි , ඉදිරි පාඩම් වලදී ඔබට තවත් මෙවැනි මිලදී ගැනීම් සම්බන්ධ සංවාද හමුවේවි. ඒවායින් තවත් දැනුම එකතු කරගන්න ඔබට පුළුවන් , එතෙක් මේ සංවාද නැවත නැවත බලමින් ඒවා හොදින් මතක තබා ගැනීමට උත්සාහ කරන්න

**Vocabulary 12**

Blame – බ්ලේම් – දොස් කියනවා, බනිනවා

Vegetable – වෙජිටබල් – එළවළු

Sugar – ෂුග(ර්) – සීනි

Milk – මිල්ක් – කිරි

Rice – රයිස් – බත් , සහල්

Rice flour – රයිස් ෆ්ලව(ර්) – සහල් පිටි

Yogurt – යෝගට් – යෝගට්

Toothpaste – ටූත්පේස්ට් – දත් බෙහෙත්

Different – ඩිෆරන්ට් – වෙනස්

Kind – කයින්ඩ් – වර්ගය

Plain – ප්ලේන් – සරල , රස නැති

Flavour – ෆ්ලේව(ර්) – රසය

Flavoured – ෆ්ලේව(ර්ඩ් – රස කල

Loaf of bread – ලෝෆ් ඔෆ් බ්‍රෙඩ් – පාන් ගෙඩිය

Biscuit – බිස්කට් – බිස්කට්

Oil – ඔයිල් – තෙල්

Coconut – කොකනට් – පොල්

Carrot – කැරට් – කැරට්

Prefer – ප්‍රිෆ(ර්) – වඩා කැමති වෙනවා

Brand – බ්‍රෑන්ඩ් – වෙළඳ නාමය

Instead – ඉන්ස්ටෙඩ් – වෙනුවට

Sold out – සෝල්ඩ් අවුට් – විකිණී අවසන්

Type – ටයිප් – වර්ගය

Store – ස්ටෝ – වෙළඳසැල / ගබඩාව

Stock – ස්ටොක් – තොගය

Elsewhere – එල්ස්වෙයා – වෙනත් තැනක

Trade – ට්‍රේඩ් – වෙළඳාම

Trader – ට්‍රේඩ(ර්) – වෙළෙන්දා

Buy – බයි – මිලදී ගන්නවා

Purchase – ප(ර්)චස් – මිලදී ගැනීම , මිලදී ගන්නවා

Sell – සෙල් – විකුණනවා

Buyer – බය(ර්) – ගැනුම්කරු

Seller – සෙල(ර්) – විකුණුම්කරු

Consumer – කන්සියුම(ර්) – පාරිභෝගිකයා

Customer – කස්ටම(ර්) – පාරිභෝගිකයා

Price – ප්‍රයිස් – මිල

Discount – ඩිස්කවුන්ට් – වට්ටම

Receipt – රිසීට් – රිසිට්පත, ලදු පත්‍රය